සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# Provincial Department of Education - NWP

| 02 | S | I |
|---|---|---|

## පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

## First Term Test - Grade 12 - 2019

විභාග අංකය ............................ **රසායන විද්‍යාව I** කාලය පැය දෙකයි

**සැලකිය යුතුයි**

- මෙම ප්‍රශ්න පත්‍රය සමග ආවර්තිතා වගුවක් සපයා ඇත.
- ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- 1 සිට 50 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන හෝ තෝරාගෙන , එය උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් යොදා දක්වන්න.

සාර්වත්‍ර වායු නියතය $R = 8.314\ J\ mol^{-1}K^{-1}$ / ඇවගාඩ්රෝ නියතය $N_A = 6.022 \times 10^{23}\ mol^{-1}$ /ප්ලාන්ක් නියතය $h = 6.626 \times 10^{-34}\ J\ s$ / ආලෝකයේ ප්‍රවේගය $C = 3 \times 10^{8}\ m\ s^{-1}$

---

1. එක් එක් විද්‍යාඥයාගේ නම හා ඔවුන්ට අදාළ ක්‍රියාකාරකම නිවැරදිවදක්වා ඇත්තේ,

| | ඉලෙක්ට්‍රෝනයේ ආරෝපණය | විකිරණශීලීතාවය | නියුට්‍රෝනය | ශක්තිය ක්වොන්ටම්කරණය වී ඇති බව |
|---|---|---|---|---|
| (1) | තොම්සන් | මාරි හා පියරි කියුරි | චැඩ්වික් | අයින්ස්ටයින් |
| (2) | මිලිකන් | බෙකරල් | චැඩ්වික් | ප්ලාන්ක් |
| (3) | මිලිකන් | රදර්ෆර්ඩ් | ස්ටෝනි | අයිස්ටයින් |
| (4) | රදර්ෆර්ඩ් | මාරි කියුරි | මාස්ඩන් | ප්ලාන්ක් |
| (5) | තොම්සන් | බෙකරල් | චැඩ්වික් | රදර්ෆර්ඩ් |

2. විශාලතම තරංග ආයාමය ඇත්තේ පහත කුමන විද්‍යුත් චුම්භක කිරණයකට ද

1. පාරජම්බුල කිරණ
2. දෘශ්‍ය කිරණ
3. අධෝරක්ත කිරණ
4. ක්ෂුද්‍ර කිරණ
5. රේඩාර් කිරණ

3. $FeO$ අණුවේ යකඩ අයනයේ ඉලෙක්ට්‍රෝන වින්‍යාසය වන්නේ,

1. $1s^2\ 2s^2\ 2p^6\ 3s^2\ 3p^6\ 3d^5\ 4s^2$
2. $1s^2\ 2s^2\ 2p^6\ 3s^2\ 3p^6\ 3d^6\ 4s^2$
3. $1s^2\ 2s^2\ 2p^6\ 3s^2\ 3p^6\ 3d^5$
4. $1s^2\ 2s^2\ 2p^6\ 3s^2\ 3p^6\ 3d^3\ 4s^2$
5. $1s^2\ 2s^2\ 2p^6\ 3s^2\ 3p^6\ 3d^6$

4. $p$ කාක්ෂික 2 ක් රේඛීය අතිච්ඡාදනයෙන් පමණක් බන්ධනයක් සාදන්නේ පහත කුමන පරමාණු යුගල අතරේද?

1. H හා H
2. H හා Cl
3. Cl හා Cl
4. O හා O
5. N හා N



iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources

(a) (b) (a) (b)

5. $CH_2 = CH - CH_3 + H_2 \rightarrow CH_3CH_2CH_3$
යන ප්‍රතික්‍රියාව සිදුවන විට,
(A) $C^a$ ලෙස දක්වා ඇති පරමාණුවේ මුහුම්කරණය $sp^2$ සිට $sp^3$ දක්වා වෙනස්වේ.
(B) $C^a$ ලෙස දක්වා ඇති පරමාණුවේ ඔක්සිකරණ අංකය -2 සිට -3 දක්වා වෙනස් වේ.
(C) $C^b$ ලෙස දක්වා ඇති පරමාණුවේ ඔක්සිකරණ අංකය $-2$ සිට $+2$ දක්වා වෙනස්වේ.
මෙම පකාශ අතරින් සත්‍ය වන්නේ,

1. A, B පමණි. 2. A, C පමණි. 3. A, B, C පමණි.
4. B පමණි. 5. A, පමණි.

6. පහත මූලද්‍රව්‍ය පරමාණු අතරින් ඉලෙක්ට්‍රෝනයක් ලබාගැනීමේ ශක්තිය ධන අගයක් වන මූලද්‍රව්‍යයක් වන්නේ,
1. Cl 2. Na 3. N 4. F 5. Al

7. නූතන ආවර්තිතා වගුව හා සම්බන්ධ **අසත්‍ය** ප්‍රකාශය වන්නේ,

1. ආවර්තිතා වගුවේ මූලද්‍රව්‍ය අතරින් බහුතරය ලෝහ වේ.
2. p ගොනුවේ මූලද්‍රව්‍ය අතර ඝන, ද්‍රව හා වායු යන අවස්ථා 3ටම අයත් මූලද්‍රව්‍ය ඇත.
3. නූතන ආවර්තිතා වගුව මූලද්‍රව්‍ය වල පරමාණුක ක්‍රමාංකය පදනම් කර සකස් කර ඇත.
4. ආවර්තිතා වගුවේ ඇති සියලුම මූලද්‍රව්‍යයන්හි න්‍යෂ්ටි තුල ප්‍රෝටෝන හා නියුට්‍රෝන ඇත.
5. ආවර්තිතා වගුවේ මුල් ආවර්ත 6 අතර කාමර උෂ්ණත්වයේ දී වායු අවස්ථාවේ දී පවතින මූලද්‍රව්‍ය සංඛ්‍යාව 11 කි.

8. $HCO_3^-$ අයනයට ඇඳිය හැකි සම්ප්‍රයුක්ත ව්‍යුහ සංඛ්‍යාව,
1. 2 2. 3 3. 4 4. 5 5. 1

- **අංක 9 හා 10 සඳහා පහත තොරතුරු යොදා ගන්න.**

9. හයිඩ්‍රජන්වල පරමාණුක වර්ණාවලියේ බාමර් ශ්‍රේණියේ පළමු රේඛාව ඇතිවන්නේ සංඛ්‍යාතය 656 nm වූ කිරණයක් මඟිනි. මෙම රේඛාව ඇති වීමට හේතු වූයේ හයිඩ්‍රජන් පරමාණුවේ කවර ශක්ති මට්ටම් අතර සිදුවූ ඉලෙක්ට්‍රෝන සංක්‍රමණය මඟින් ද?

1. $n = 3$ සිට $n = 2$ 2. $n = 2$ සිට $n = 1$ 3. $n = 1$ සිට $n = 2$
4. $n = 2$ සිට $n = 3$ 5. $n = 3$ සිට $n = 1$

10. එම තරංග ආයාමය සහිත කිරණයේ ෆෝටෝනයක අඩංගු ශක්තිය (kJ)
1. $3 \times 10^{-30}$ 2. $3 \times 10^{-13}$ 3. $3 \times 10^{--9}$ 4. $3 \times 10^{-28}$ 5. $3 \times 10^{-12}$

11. $H$ හා $C$ පමණක් අඩංගු සංයෝග හඳුන්වන්නේ, හයිඩ්‍රොකාබන ලෙසය. එක්තරා හයිඩ්‍රොකාබනයක ස්කන්ධය අනුව $H$ ප්‍රතිශතය 12% ක් පමණ වේ. එම සංයෝගයේ සාපේක්ෂ අණුක ස්කන්ධය 100 පමණ වේ. එම හයිඩ්‍රොකාබනයේ නිවැරදි සා.අ.ස්. වන්නේ,
1. 96 2. 98 3. 100 4. 94 5. 102

12. කැතෝඩ කිරණවල ගුණයක් නොවන්නේ,
1. ඒවා ගමන් කරන මාර්යක් විද්‍යුත් ක්ෂේත්‍රයක් යෙදූවිට ඒවා ධන තහඩුව වෙතට ආකර්ෂණයවේ.
2. විවිධ වායු වලින් ලැබෙන කැතෝඩ කිරණවල e/m අනුපාතය නියතයක් වේ.
3. චුම්භක ක්ෂේත්‍රයක දී උත්තර ධ්‍රැවය දිශාවට උත්ක්‍රමණයක් දක්වයි.
4. ඒවා සරල රේඛීයව ගමන් කරයි.
5. කැතෝඩ කිරණවල ස්වභාවය කැතෝඩ කිරණ නලය තුළ ඇති වායුව හෝ කැතෝඩය සාදා ඇති ද්‍රව්‍ය මත රඳා නොපවතී.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

13. $l = 3$ න් දෙනු ලබන උපශක්ති මට්ටම තුළ පැවතිය හැකි උපරිම ඉලෙක්ට්‍රෝන සංඛ්‍යාව,

1. 32  2. 6  3. 8  4. 18  5. 14

14. $Se$ වල පරමාණුක ක්‍රමාංකය 34 වේ. එහි සංයුජතා කවචවල ඇති ඉලෙක්ට්‍රෝනවල කාක්ෂික සටහන නිවැරදිව දක්වා ඇත්තේ,







15. පහත දක්වා ඇති සංයෝග අතරින් විද්‍යුත් ඍණතාවය වැඩිම $C$ පරමාණුව අඩංගු වන සංයෝගය වන්නේ,

1. $COCl_2$  2. $CH_3Cl$  3. $CH_3F$

4. $CH_4$  5. $H-\overset{\overset{\displaystyle O}{||}}{C}-H$

16. පහත අණුවේ ඇති $\sigma$ හා $\pi$ බන්ධන සංඛ්‍යාව පිළිවෙලින්,



1. 7,2  2. 8,1  3. 8,2  4. 7,1  5. 5,4

17. සල්ෆර් සාදන ඔක්සයිඩයක $S$ හා $O$ අතර ස්කන්ධ අනුපාතය 1:1 වේ. එම ඔක්සයිඩයේ අණුක සූත්‍රය,

1. $SO_3$  2. $SO$  3. $SO_4$  4. $S_2O_3$  5. $SO_2$

18. $NaHPO_4$ හි IUPAC නාමය වනුයේ,

1. sodium phosphate
2. sodium hydrogen phosphate
3. sodium hydrogenphosphate
4. sodiam hydrogenphosphate
5. sodium biphosphate

19. ආවර්තිතා වගුවේ කාණ්ඩයක් ඔස්සේ පහළට හා ආවර්තයක් ඔස්සේ වමේ සිට දකුණට පරමාණුක අරය, පළමු අයනීකරණ ශක්තිය හා විද්‍යුත් ඍණතාවය විචලනය වන අන්දම වඩා නිවැරදිව පැහැදිලි කරන්නේ,

| | | කාණ්ඩයේ පහළට | ආවර්තයේ වමේ සිට දකුණට |
|---|---|---|---|
| (1) | පරමාණුක අරය | වැඩිවේ | වැඩිවේ |
| (2) | පළමු අයනීකරණ ශක්තිය | වැඩිවේ | අඩුවේ |
| (3) | විද්‍යුත් ඍණතාවය | වැඩිවේ | වැඩිවේ |
| (4) | පරමාණුක අරය | වැඩිවේ | අඩුවේ |
| (5) | පළමු අයනීකරණ ශක්තිය | අඩුවේ | සාමාන්‍යයෙන් වැඩිවේ |



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

20. A, B, C හා D නම් අනුයාත මූලද්‍රව්‍ය 4 ක අනුයාත අයනීකරණ ශක්ති දත්ත පහත දැක්වේ.

| මූල ද්‍රව්‍ය | අනුයාත අයනීකරණ ශක්තිය $kJmol^{-1}$ | | | |
|---|---|---|---|---|
| | $I_1$ | $I_2$ | $I_3$ | $I_4$ |
| A | 2100 | 3950 | 6150 | 9300 |
| B | 490 | 4560 | 6950 | 9500 |
| C | 736 | 1450 | 7750 | 10500 |
| D | 575 | 1800 | 2740 | 11600 |

ආවර්තිතතා වගුවේ A, B, C හා D අයත්වන කාණ්ඩය වන්නේ,

1. 18 , 1 , 2 , 3
2. 18 , 1 , 2 , 13
3. 8 , 1 , 2 , 13
4. 8 , 1 , 2 , 3
5. 1 , 2 , 13 , 14

21. ඝන $Al(NO_3)_3$ සංයෝගයේ $2.13\ g$ ක් ආස්‍රැත ජලය $100\ cm^3$ ක් තුල දියකර $P$ ද්‍රාවණ පිලියෙළ කර ඇත. එම ද්‍රාවණයෙන් $10\ cm^3$ ක් වෙන්කර ගෙන එයට $1\ dm^3$ ක් වන තුරු ජලය එක් කිරීමෙන් $Y$ ද්‍රාවණය පිලියෙළ කර ඇත. $Y$ ද්‍රාවණය තුළ ඇති $NO_3^-$ සාන්ද්‍රණය $ppm$ වලින්, $(Al = 27\ ,\ N = 14\ ,\ O = 16)$

1. 62
2. 18.6
3. 186
4. 184
5. 86

22. කෝණික ගම්‍යතා ක්වොන්ටම් අංකය හෙවත් උද්දිගංශ ක්වොන්ටම් අංකය මඟින් විස්තර වන්නේ,

1. කාක්ෂිකයේ දිශානතිය
2. කාක්ෂිකය තුල ඉලෙක්ට්‍රෝන බෑවුම
3. කාක්ෂිකයක හැඩය
4. උප කවච සංඛ්‍යාව
5. පරමාණුව තුල ඉලෙක්ට්‍රෝන අන්තර්ගත වන ප්‍රධාන ශක්තිමට්ටම

23. $N^{3-}$ , $O^{2-}$ , $F^-$ හා $Ne$ යන අයන / මූලද්‍රව්‍ය පිළිබඳ **<u>අසත්‍ය</u>** ප්‍රකාශය වන්නේ,

1. ඒවායේ න්‍යෂ්ටියේ Ne වල න්‍යෂ්ටියේ ඇති ප්‍රෝටෝන සංඛ්‍යාවට සමාන ප්‍රෝටෝන සංඛ්‍යාවක් ඇත.
2. ඒවායේ අරයන් $N^{3-} > O^{2-} > F^- > Ne$ ලෙස විචලනය වේ.
3. ඒවා සම ඉලෙක්ට්‍රොනික වේ.
4. ඒවාට එකම ඉලෙක්ට්‍රොනික වින්‍යාසයක් ඇත.
5. ඒවායේ න්‍යෂ්ටික ආරෝපණය $N^{3-} < O^{2-} < F^- < Ne$ ලෙස විචලනය වේ.

24. පහත ප්‍රතික්‍රියා මඟින් දක්වා ඇති ක්‍රියාවලි නිවැරදිව දක්වා ඇත්තේ,

**(A)** $X(g) \rightarrow X^+(g) + e$

**(B)** $Y(g) + e \rightarrow Y^-(g)$

**(C)** $Z^-(g) \rightarrow Z(g) + e$

| | ඉලෙක්ට්‍රෝන ලබා ගැනීමේ ශක්තිය | ඉලෙක්ට්‍රෝන බන්ධුතාවය | පළමු අයනීකරණ ශක්තිය |
|---|---|---|---|
| (1) | A | B | C |
| (2) | B | C | A |
| (3) | A | C | B |
| (4) | B | A | C |
| (5) | C | B | A |



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources

25. ඝනත්වය $1.17\ g\ cm^{-3}$ ද, ස්කන්ධය අනුව 36.5% ක් $HCl$ අඩංගු වන $HCl$ ද්‍රාවණයක සාන්ද්‍රණය වන්නේ $(mol\ dm^{-3})$,

1. 10.32 2. 11.7 3. 12.42 4. 11.54 5. 12.5

26. පහත අණු / අයන අතුරින් ද්වි ධ්‍රැව සූර්ණය ශුන්‍ය අණුවක් / අයනයක් වන්නේ,

1. $CH_3Cl$ 2. HCl 3. $SO_3^{2-}$ 4. $XeF_4$ 5. $PCl_5$

27. සාන්ද්‍රණය $0.1\ moldm^{-3}$ වන $AgNO_3(aq)$ ද්‍රාවණයකින් $25\ cm^3$ක් සාන්ද්‍රණය $0.25\ mol\ dm^{-3}$ වන $KCl\ (aq)$ ද්‍රාවණයක $10\ cm^3$ ක් සමඟ මිශ්‍ර කල විට සෑදෙන $AgCl(s)$ අවක්ෂේපයේ ස්කන්ධය කුමක්ද?
$Ag = 108$ , $Cl = 35.5$
ප්‍රතික්‍රියාව
$AgNO_3\ (aq) + KCl\ (aq) \rightarrow AgCl\ (s) + KNO_3(aq)$

1. 362 mg 2. 359 mg 3. 361 mg 4. 3.62 g 5. 3.59 g

28. පහත දැක්වෙන න්‍යෂ්ටික ප්‍රතික්‍රියාව සළකන්න.

$${}^{9}_{4}Be + {}^{4}_{2}He \rightarrow {}^{12}_{6}C + X$$

$X$ යනු,

1. $\beta$ අංශුවකි 2. $\gamma$ කිරණයකි 3. නියුට්‍රෝනයකි 4. ප්‍රෝටෝනයකි 5. $\alpha$ අංශුවකි

පහත දී ඇති අණුව සළකා (29) හා (30) ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




29. ඉහත අණුවේ A, B, C ලෙස දක්වා ඇති කාබන් පරමාණුවල මුහුම්කරණය පිළිවෙළින්,

1. $sp$ , $sp^3$ , $sp$ 2. $sp^2$ , $sp$ , $sp^2$ 3. $sp^3$ , $sp$ , $sp^2$
4. $sp^2$ , $sp$ , $sp^3$ 5. $sp^2$ , $sp^2$ , $sp^3$

30. ඉහත අණුවේ $a, b, c$ ලෙස දක්වා ඇති බන්ධනවල දිග ආරෝහණය වන අනුපිළිවල නිවැරදිව දක්වා ඇත්තේ,

1. $a < b < c$ 2. $b < c < a$ 3. $b < a < c$
4. $a < c < b$ 5. $c < b < a$

- **අංක 31 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (a), (b), (c) සහ (d) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය / ප්‍රතිචාර කවරේ දැයි තෝරා ගන්න.**
**(a) සහ ( b) පමණක් නිවැරදි නම් ( 1 ) මත ද**
**(b) සහ ( c) පමණක් නිවැරදි නම් ( 2 ) මත ද**
**(c) සහ ( d) පමණක් නිවැරදි නම් ( 3 ) මත ද**
**(a) සහ (d) පමණක් නිවැරදි නම් ( 4 ) මත ද**
වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් (5) මත ද උත්තර පත්‍රයෙහි දැක්වෙන උපදෙස් පරිදි ලකුණු කරන්න.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers Study Resources
iexamhub

ඉහත උපදෙස් සම්පිණ්ඩනය

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| (a) සහ (b) පමණක් නිවැරදියි | (b) සහ (c) පමණක් නිවැරදියි | (c) සහ (d) පමණක් නිවැරදියි | (d) සහ (a) පමණක් නිවැරදියි | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදියි |

31. $^{12}C$ පරමාණුවක ස්කන්ධය වන්නේ,

a). $\frac{12}{6.022 \times 10^{23}}$ g  b). 12 u  c). $\frac{12}{6.022 \times 10^{23}} \times \frac{1}{12}$ g  d). $\frac{6.022 \times 10^{23}}{12}$ g

32. ද්විධ්‍රැව ඝූර්ණය ශූන්‍ය **නොවන** අණුවක් / අණු වන්නේ,

a) $BCl_3$  b) $NH_3$  c) $SO_2$  d) $SF_6$

33. පහත අණු / අයන අතරින් අෂ්ටක නියමය අනුගමනය **නොකරන** අවස්ථාවක් / අවස්ථා වන්නේ,

a) $BeCl_2$  b) $NO_2$  c) $CO_2$  d) $PCl_5$

34. සමාන නිර්යුග්මක ඉලෙක්ට්‍රෝන සංඛ්‍යාවක් ඇති අයන / පරමාණු වන්නේ,

(a) $Ni^{2+}$  (b) $Fe^{3+}$  (c) V  (d) Si

35. පහත අණු /අයන අතරින් හැඩය හා ඉලෙක්ට්‍රෝන ජ්‍යාමිතිය එක හා සමාන වන්නේ,

a) $SO_4^{2-}$  b) $CH_4$  c) $PCl_3$  d) $ICl_3$

36. පහත අණු අතර පවතින ප්‍රධාන ද්විතික අන්තර් ක්‍රියා නිවැරදිව දක්වා ඇත්තේ,

(a) $H_2O\ (l)$ – $H$ බන්ධන
(b) $Cl_2(g)$ හා $H_2O\ (l)$ – $H$ බන්ධන, ද්විධ්‍රැව - ප්‍රේරිත ද්විධ්‍රැව අන්තර්ක්‍රියා
(c) $HCl(g)$ – $H$ බන්ධන
(d) $Xe(g)$ – ලන්ඩන් බල

37. පහත ප්‍රතික්‍රියාව සළකන්න.

$$MnO_4^- + 5Fe^{2+} + 8H^+ \rightarrow Mn^{2+} + 5\,Fe^{3+} + 4H_2O$$

මෙම ප්‍රතික්‍රියාව සම්බන්ධ සත්‍ය වන්නේ,

(a) $MnO_4^-$ හි ඔක්සිකරණ අංකය +6 සිට +2 දක්වා අඩුවේ.
(b) $MnO_4^-$ හි ඔක්සිකරණ අංකය +7 සිට +2 දක්වා අඩුවේ.
(c) $Fe^{2+}$ , $Fe^{3+}$ දක්වා ඔක්සිකරණය වේ.
(d) මෙම ප්‍රතික්‍රියාවේ දී $MnO_4^-$ ඔක්සිහාරකය ලෙස ක්‍රියා කරයි.

38. පහත දක්වා ඇත්තේ $N$ දක්වන ඔක්සිකරණ අවස්ථා 4 කි.

+5 , +3 , +1 , -3

එම ඔක්සිකරණ අවස්ථා දක්වන සංයෝග / අයන සඳහා උදාහරණ නිවැරදිව පිළිවෙලින් දක්වා ඇත්තේ,

(a) $N_2O_5$ , $N_2O$ , $N_2O_3$ , $NH_4^+$  (b) $NO_3^-$ , $N_2O$ , $NO_2$ , $NH_3$
(c) $N_2O_5$ , $N_2O_3$ , $N_2O$ , $NH_4Cl$  (d) $NO_2F$ , $NO_2^-$ , $NO_2$ , $NH_3$



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources

39. පහත ඉලෙක්ට්‍රෝන වින්‍යාස අතරින් නිවැරදි වින්‍යාසය / වින්‍යාසයක් වන්නේ,

(a) $[Ar]3d^{10}4s^{1}$ (b) $[Kr]5s^{2}5p^{2}$ (c) $[Ar]3d^{4}4s^{2}$ (d) $[Ne]3s^{2}3p^{6}$

40. රසායනික බන්ධන පිලිබඳ සත්‍යවන්නේ,

(a) සංයුජතා කවචයේ ඉලෙකට්‍රෝන අෂ්ඨකය නොමැති පරමානු එම අඩුපාඩුව සම්පූර්ණ කර ගැනීමට දරණ උත්සාහයක් ලෙස රසායනික බන්ධන නිර්මාණය වේ.

(b) එකම වර්ගයේ මූල ද්‍රව්‍ය පරමාණු 2ක් අතර ඉලෙක්ට්‍රෝන යුගලයක් හවුලේ තබා ගැනීමෙන් පමණක් සහසංයුජ බන්ධන නිර්මාණය වේ.

(c) අයනික බන්ධන ඇතිවීමේ දී ධන අයන (කැටායන) හා ඍණ අයන (ඇනායන) අතර ස්ථිති විද්‍යුත් ආකර්ෂණ බල ඇතිවේ.

(d) පරමාණු 2ක් අතර හවුලේ තබා ගන්නා ඉලෙක්ට්‍රෝන යුගලයම එක් පරමාණුවකින් සැපයූ විට නිර්මාණය වන්නේ දායක සංයුජ බන්ධන වේ.

- **අංක 41 සිට 50 තෙක් එක් ප්‍රශ්නයක් සඳහා ප්‍රකාශ දෙකක් ඉදිරිපත් කර ඇත. එම ප්‍රකාශ යුගලම හොඳින්ම ගැලපෙනුයේ පහත දැක්වෙන පරිදි (1), (2), (3), (4) සහ (5) යන ප්‍රතිචාර වලින් කවර ප්‍රතිචාරය දැයි තෝරා උත්තර පත්‍රයේ උචිත ලෙස ලකුණු කරන්න.**

| ප්‍රතිචාරය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | සත්‍යය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය නිවැරදිව පහදා දෙයි |
| 2 | සත්‍යය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය නිවැරදිව පහදා නොදේ |
| 3 | සත්‍යය | අසත්‍යය |
| 4 | අසත්‍යය | සත්‍යය |
| 5 | අසත්‍යය | අසත්‍යය |

| | පළමු ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 41. | උච්ච වායූන් අතරින් විශාලම පළමු අයනීකරණ ශක්තිය ඇත්තේ He වලටය. | He හි වලට ඇත්තේ 1 s ඉලෙක්ට්‍රෝන පමණකි. |
| 42. | එකම මූලද්‍රව්‍යයේ සංස්ථානික වලට, සමාන පරමාණුක ක්‍රමාංක හා වෙනස් ස්කන්ධ ක්‍රමාංක ඇත. | සමස්ථානික වල භෞතික ගුණ හා රසායනික ගුණ සමාන වේ. |
| 43. | $AlCl_3$ හා $NH_3$ හි බන්දන කෝණ එකිනෙකට සමාන වේ. | $Al$ පරමාණුව වටා මෙන්ම $N$ පරමාණුව වටා ද ඉලෙක්ට්‍රෝන විකර්ෂණ කාණ්ඩ 3 බැගින් ඇත. |
| 44. | $Cl^{-}$ අයනයේ හා $Ar$ පරමාණුවේ අරය එකිනෙකට සමාන වේ. | $Cl^{-}$ අයනයට හා $Ar$ පරමාණුවට සමාන ඉලෙක්ට්‍රෝන වින්‍යාසයක් ඇත. |
| 45. | $CF_4$ අණුව ධ්‍රැවීය අණුවකි. | $C$ ට වඩා $F$ ගේ විද්‍යුත් ඍණතාවය වැඩිය. |
| 46. | $Br_2$ වලට වඩා $I_2$ වල තාපාංකය ඉහළ අගයක් ගනී. | විශාල අණුක ස්කන්ධ සහිත අණුවල භෞතික ගුණ නිර්ණය කිරීමේ දී ප්‍රමුඛ වන ආකර්ෂණ බල වන්නේ ලන්ඩන් අපකිරණ බල වේ. |
| 47. | $Na$ හා $Cl$ අතර බන්ධනයේ අයනික ස්වභාවයට වඩා $K$ හා $Cl$ අතර බන්ධනයේ අයනික ස්වභාවය අඩුය. | අණුවල බන්ධන සාදන පරමාණු 2ක් අතර විද්‍යුත් ඍණතා වෙනස විසින් බන්ධනයේ අයනික හෝ සහසංයුජ ස්වභාවය නිර්ණය කරනු ලැබේ. |
| 48. | අයිස්වල ඝනත්වය ජලයට වඩා අඩුය. | $0^{0}\,C$ දී සෑම ජල අණුවක් වටාම චතුස්තලීය ආකාරයට $H -$ බන්ධන 4 ක් බැගින් ඇත. |
| 49. | ආවර්තිතා වගුවේ එකම කාණ්ඩයට අයත් මූල ද්‍රව්‍යවල භෞතික හා රසායනික ගුණ සමාන වේ. | එකම කාණ්ඩයට අයත් මූලද්‍රව්‍යවල ඉලෙක්ට්‍රෝනික වින්‍යාස එකිනෙකට සමානය. |
| 50. | $Na$ වල ලෝහක බන්ධනයට වඩා $Mg$ වල ලෝහක බන්ධනයේ ප්‍රභලතාවය වැඩිය. | $Na^{+}$ අරයට වඩා $Mg^{2+}$ අරය විශාලය. |



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

## ආවර්තිතා වගුව
## ஆவர்த்தன அட்டவணை
# Periodic Table

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1 H | | | | | | | | | | | | | | | | | 2 He |
| 2 | 3 Li | 4 Be | | | | | | | | | | | 5 B | 6 C | 7 N | 8 O | 9 F | 10 Ne |
| 3 | 11 Na | 12 Mg | | | | | | | | | | | 13 Al | 14 Si | 15 P | 16 S | 17 Cl | 18 Ar |
| 4 | 19 K | 20 Ca | 21 Sc | 22 Ti | 23 V | 24 Cr | 25 Mn | 26 Fe | 27 Co | 28 Ni | 29 Cu | 30 Zn | 31 Ga | 32 Ge | 33 As | 34 Se | 35 Br | 36 Kr |
| 5 | 37 Rb | 38 Sr | 39 Y | 40 Zr | 41 Nb | 42 Mo | 43 Tc | 44 Ru | 45 Rh | 46 Pd | 47 Ag | 48 Cd | 49 In | 50 Sn | 51 Sb | 52 Te | 53 I | 54 Xe |
| 6 | 55 Cs | 56 Ba | La-Lu | 72 Hf | 73 Ta | 74 W | 75 Re | 76 Os | 77 Ir | 78 Pt | 79 Au | 80 Hg | 81 Tl | 82 Pb | 83 Bi | 84 Po | 85 At | 86 Rn |
| 7 | 87 Fr | 88 Ra | Ac-Lr | 104 Rf | 105 Db | 106 Sg | 107 Bh | 108 Hs | 109 Mt | 110 Uun | 111 Uuu | 112 Uub | 113 Uut | | | | | |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 57 La | 58 Ce | 59 Pr | 60 Nd | 61 Pm | 62 Sm | 63 Eu | 64 Gd | 65 Tb | 66 Dy | 67 Ho | 68 Er | 69 Tm | 70 Yb | 71 Lu |
| 89 Ac | 90 Th | 91 Pa | 92 U | 93 Np | 94 Pu | 95 Am | 96 Cm | 97 Bk | 98 Cf | 99 Es | 100 Fm | 101 Md | 102 No | 103 Lr |



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## Provincial Department of Education - NWP

**02 | S | II**

### පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019
### First Term Test - Grade 12 - 2019

විභාග අංකය .............................. **රසායන විද්‍යාව II** කාලය පැය තුනයි

* ආවර්තිතා වගුවක් අවසාන පිටුවෙහි සපයා ඇත.
* **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
* සාර්වත්‍ර වායු නියතය, $R = 8.314\ J\ K^{-1}\ mol^{-1}$
* ඇවගාඩ්රෝ නියතය, $N_A = 6.022 \times 10^{23}\ mol^{-1}$
* ප්ලාන්ක් නියතය, $h = 6.626 \times 10^{-34}\ J\ s$
* ආලෝකයේ ප්‍රවේගය, $c = 3 \times 10^{8}\ ms^{-1}$

**A කොටස - ව්‍යුහගත රචනා**

* සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
* ඔබේ පිළිතුරු එක් එක් ප්‍රශ්නයට ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නො වන බව ද සලකන්න.

**B කොටස සහ C කොටස - රචනා**

* එක් එක් කොටසින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගනිමින් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි භාවිත කරන්න.
* සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු A, B සහ C කොටස්වලට පිළිතුරු, A කොටස මුලින් තිබෙන පරිදි එක් පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.
* ප්‍රශ්න පත්‍රයෙහි B සහ C කොටස් **පමණක්** විභාග ශාලාවෙන් පිටතට ගෙන යා හැකි ය.

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| කොටස | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| C | 8 | |
| | 9 | |
| | 10 | |
| එකතුව | | |
| ප්‍රතිශතය | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

**සංකේත අංක**

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| පරීක්ෂා කළේ : | |
| අධීක්ෂණය කළේ : | |

[දෙවැනි පිටුව බලන්න.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

## A කොටස - ව්‍යුහගත රචනා

(01) a). පහත සඳහන් ප්‍රශ්න ආවර්තිතා වගුවේ දෙවන ආවර්තයේ මූලද්‍රව්‍ය හා සම්බන්ධ වේ.
i සිට v දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී ලබා දි ඇති අවකාශයේ මූලද්‍රව්‍යයේ / සංයෝගයේ සංකේතය / රසායනික සූත්‍රය ලියන්න.

i. ඉහළම දෙවන අයනීකරණ ශක්තිය සහිත මූලද්‍රව්‍ය ..................................

ii. ඉලෙක්ට්‍රෝන ලබා ගැනීමේ ශක්තිය ධන අගයක් පෙන්වන මූලද්‍රව්‍යය / මූලද්‍රව්‍ය ...............................

iii. ඉහළම තාපාංකය සහිත මූලද්‍රව්‍ය ................................

iv. විද්‍යුත් ඍණතාවය අඩුම හා විද්‍යුත් ඍණතාවය වැඩිම මූලද්‍රව්‍ය දෙක මඟින් සාදන සංයෝගයේ රසායනික සූත්‍රය ..................................

v. බොහෝ විට ඉලෙක්ට්‍රෝන ඌන ඊර්බීය සහසංයුජ සංයෝග සාදන මූලද්‍රව්‍යය ....................................

a). i $CH_3NO_3$ (මෙතිල් නයිට්‍රේට්) අණුව සඳහා වඩාත්ම පිළිගත හැකි ලුවිස් තිත් ඉරි ව්‍යුහය අඳින්න. එහි සැකිල්ල පහත දැක්වේ.



ii. $NO_2F$ අණුව සඳහා වඩාත්ම ස්ථායී ලුවිස් තිත් ඉරි ව්‍යුහය පහත දක්වා ඇත. මෙම අණුව සඳහා තවත් ලුවිස් තිත් ඉරි ව්‍යුහ (සම්ප්‍රයුක්ත ව්‍යුහ) 2ක් අඳින්න. ඒවායේ සාපේක්ෂ ස්ථායීතාවය සඳහන් කරන්න. ස්ථායීතාවයට හේතු ද දක්වන්න.





www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

iii. පහත සඳහන් ලුවිස් තිත් ඉරි ව්‍යුහය පදනම් කරගෙන වගුවේ දක්වා ඇති O හා C පරමාණු වල,

I. පරමාණුව වටා VSEPR යුගල් සංඛ්‍යාව

II. පරමාණුව වටා ඉලෙක්ට්‍රෝන යුගල් ජ්‍යාමිතිය

III. පරමාණුව වටා හැඩය

IV. පරමාණුවේ මුහුම්කරණය

V. ඔ'කරණ අංකය සඳහන් කරන්න.



පහත දැක්වෙන පරිදි පරමාණු අංකනය කර ඇත.



| පරමාණුව | $O^2$ | $C^3$ |
|---|---|---|
| I. පරමාණුව වටා VSEPR යුගල් සංඛ්‍යාව | | |
| II. පරමාණුව වටා ඉලෙක්ට්‍රෝන යුගල් ජ්‍යාමිතිය | | |
| III. පරමාණුව වටා හැඩය | | |
| IV. පරමාණුවේ මුහුම්කරණය | | |
| V. ඔ'කරණ අංකය | | |

iv. ඉහත iii කොටසෙහි දී ඇති ලුවිස් තිත් ඉරි ව්‍යුහයේ පහත සඳහන් $\sigma$ බන්ධන සෑදීමට සහභාගි වන පරමාණුක / මුහුම් කාක්ෂික සඳහන් කරන්න.

I. $H - O^2$ H ………………………… $O^2$ …………………………

II. $O^2 - C^3$ $O^2$ ………………………… $C^3$ …………………………

III. $C^3 - C^4$ $C^3$ ………………………… $C^4$ …………………………

IV. $C^4 - O^6$ $C^4$ ………………………… $O^6$ …………………………

iv. ඉහත iii කොටසෙහි දී ඇති ලුවිස් තිත් ඉරි ව්‍යුහයෙහි පහත සඳහන් $\pi$ බන්ධන සෑදීමට සහභාගි වන පරමාණුක කාක්ෂක හඳුනා ගන්න. (පරමාණුවල අංකනය iii කොටසෙහි පරිදිම වේ.)

I. $C^3 - O^7$ $C^3$ ………………………… $O^7$ …………………………

II. $C^4 - O^6$ $C^4$ ………………………… $O^6$ …………………………



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

c) වරහන් තුළ දක්වා ඇති ගුණය වැඩිවන පිළිවලට පහත සඳහන් දෑ සකසන්න. (හේතු අවශ්‍ය නොවේ.)

(i) $NH_3$ , $NH_2^-$ , $NH_4^+$ (N පරමාණුවේ විද්‍යුත් ඍණතාවය)

..........................................................................................................................................

(ii) $NOCl$ , $NO_2^-$ , $NO^+$ ($N-O$ බන්ධන දිග)

..........................................................................................................................................

(iii) $MgCO_3$ , $BeCO_3$ , $CaCO_3$ ( වියෝජන උෂ්ණත්වය)

..........................................................................................................................................

(02) a) i පරමාණුක ක්‍රමාංකය 24 වන ක්‍රෝමියම් මූලද්‍රව්‍යයේ මූලද්‍රව්‍යයේ භූමි අවස්ථාවේ ඉලෙක්ට්‍රෝන වින්‍යාසය හා භූමි අවස්ථාවේ ඇති ක්‍රෝමියම් පරමාණුවක ඇති නිර්යුග්මක ඉලෙක්ට්‍රෝන සංඛ්‍යාව ලියන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

ii. ක්‍රෝමියම් හි සම්පිණ්ඩිත ඉලෙක්ට්‍රෝන වින්‍යාසය ලියන්න.

iii. ක්‍රෝමියම් සාදන +3 හා +6 කැටායන වල ඉලෙක්ට්‍රෝන වින්‍යාස ලියන්න.

iv. ක්‍රෝමියම් +3 අයනයේ බහිර් ඉලෙක්ට්‍රෝන සංඛ්‍යාව කොපමණද?

v. ක්‍රෝමියම්හි +6 ඔක්සිකරණ අවස්ථාව සහිත ඇනායනයක් සඳහන් කර එහි IUPAC නාමය ලියන්න.

vi. පහත සංයෝග 2 හි IUPAC නාම සඳහන් කරන්න.

$NaClO$ ..........................................................................................................................

$Fe_2S_3$ ..........................................................................................................................



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

vii. ප්‍රාථමික හා ද්විතීයික අන්තර් ක්‍රියා සම්බන්ධ පහත වගුව සම්පූර්ණ කරන්න.

| අන්තර් ක්‍රියා වර්ගය / ද්‍රව්‍යය | ප්‍රාථමික අන්තර්ක්‍රියා | ද්විතියික අන්තර් ක්‍රියා |
|---|---|---|
| i. ද්‍රව බ්‍රෝමීන් | | |
| ii. ඝන සෝඩියම් | | |
| iii. හයිඩ්‍රජන් ෆ්ලූවොරයිඩ් | | |
| iv. අයිස් | | |
| v. පැරා නයිට්‍රොෆීනෝල් | | |

b) පහත රූප සටහනේ දැක්වෙන්නේ තරංග ආයාමය සමඟ විචලනය වන H හි රේඛා වර්ණාවලිය යි.




i. A, B, C රේඛා ශ්‍රේණි හඳුනාගන්න. එම එක් එක් ශ්‍රේණි අයත් වන්නේ විද්‍යුත් චුම්බක වර්ණාවලියේ කවර ප්‍රදේශවලටදැයි ලියා දක්වන්න.

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

ii. එක් එක් රේඛා ශ්‍රේණියේ තරංග ආයාමය ඉහළම රේඛාවට අදාළ $n_f$ හා $n_i$ අගයන් සඳහන් කරන්න.

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

iii. H හි විමෝචන වර්ණාවලියේ රේඛා ශ්‍රේණි වෙන් වෙන්ව පිහිටන්නේ මන්දැයි සඳහන් කරන්න.

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

iv. B රේඛා ශ්‍රේණියේ P, Q, R, S ලෙස දැක්වෙන එක් එක් රේඛාවල වර්ණයන් මොනවාද?

.....................................................................................................................................

.....................................................................................................................................

c) පරමාණුක කාක්ෂිකයන් විස්තර කෙරෙන n, l, $m_l$ යන ක්වොන්ටම් අංක සම්බන්ධ පහත වගුව සම්පූර්ණ කරන්න.

| **ක්වොන්ටම් අංකය** | **n** | **l** | **$m_l$** | **පරමාණුක කාක්ෂික** |
|---|---|---|---|---|
| I | ............................. | ............................. | +1 | 2P |
| II | 4 | 2 | -2 | ............................. |
| III | ............................. | ............................. | ............................. | 3S |

i. තරංග ආයාමය 700nm ක් වූ රතු ආලෝකයේ ෆෝටෝනයක ශක්තිය ගණනය කරන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

ii. රතු ආලෝකයේ ෆෝටෝන මවුලයකින් සැපයෙන ශක්තිය ගණනය කරන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

(03) a) i. ප්‍රධාන ඵල ලෙසට $Mn^{2+}$ හා $SO_4^{2-}$ අයන සාදමින් $KMnO_4$ හා $SO_2(g)$ අතර සිදුවන ප්‍රතික්‍රියාව,

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

ii. ප්‍රධාන ඵල ලෙසට $Fe^{2+}$ හා $MnO_2$ ලබා දෙමින් $KMnO_4$ හා $Fe$ අතර භාෂ්මික මාධ්‍යයේ දී සිදුවන ප්‍රතික්‍රියාව,

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

මෙම (i) සහ (ii) ප්‍රතික්‍රියා සඳහා අර්ධ අයනික සමීකරණ මගින් තුලිත රසායනික සමීකරණය ලබාගන්න.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

b) i. $MSO_4.xH_2O$ අණුක සූත්‍රය ඇති සංයෝගයක ජලය 36% ක් අඩංගු වේ නම් $x$ හි අගය ගණනය කරන්න. (M = 64 , S = 32 , O = 16 , H = 1)

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

*ii.* $CuO$ *භාවිතයෙන්* $Cu$ *නිස්සාරණය කිරීමේ දී* $Cu$ $200kg$ *ක් ලබා ගැනීමට අවශ්‍ය* $CuO$ *ස්කන්ධය ගණනය කරන්න.* (Cu = 63.5 , O = 16)

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

(04) a) i. සංයෝගයක $Na = 18.5\%$ , $S = 25.8\%$ , $O = 51.6\,\%$ , $H = 4\,\%$ ක් ද ඇති අතර මවුලික ස්කන්ධය $248\ gmol^{-1}$ වූ සංයෝගයක අණුක සූත්‍රය නිර්ණය කරන්න. (Na = 23 , O = 16 , S = 32, H = 1)

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

